**ජාතික ශිල්ප සභාව - 2013**

ජාතික ශිල්ප සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ .

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ශිල්ප සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ජංගම නොවන වත්කම් වශයෙන් දක්වා තිබූ නමුත් ඒ වත්කමේ ස්වභාවය පිළිබඳ නොසලකා රු.718,228 ක් වටිනා පුස්තකාල පොත් සඳහා වූ ක්ෂය ප්‍රතිපත්තිය නිශ්චය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සමස්ථ ජංගම නොවන වත්කම් රජයේ ප්‍රදානයන්ගෙන් මිලදීගෙන වාර්ෂිකව ක්ෂයකර ඇතත් එය අදාල ක්ෂය ක්‍රමක්ෂය ලෙස ලියාහැරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රදානවල වටිනාකම 88,290,000 වුවද ඒ මත නියෝජනය වූ ජංගම නොවන වත්කම්වල ශුද්ධ වටිනාකම රු.60,884,509 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ශිල්පීනේග් සුභසාධනය සඳහා ඇතිකර තිබුණු ශිල්ප සුභසාධන අරමුදල මගින් හස්ත කර්මාන්ත ශිල්පීනේග් සුභසාධන කටයුතු සහ ශිල්පීන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ මිලදී ගැනීම හා විකිණීමෙන් සේවාවක් ලබා දීමට කටයුතු කර තිබුණි. නමුත් මෙම අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය දැක්වෙන පරිදි වෙනම ගිණුම් තබා නොතිබූ අතර එකතුව රු.3,491,102 ක් වූ කොළඹ කොටුව සහ මොලගොඩ යන අලෙවිසැල් වල අවසන් තොගය සහ ලක්සල ආයතනයට පවරාගත් පිරිවැය රු.5,660,058 ක් වූ භාණ්ඩ වෙනුවෙන් ලැබිය යුතු මුදල ගිණුම් වලින් අනාවරණය කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යටතේ දිවයින පුරා පිහිටි ශිල්පීය පුහුණු මධ්‍යස්ථානවලට අයිතිව තිබූ රු. මිලියන 46 ක් වූ දේපල, ජාතික ශිල්ප සභාව වෙත පවරා තිබූ නමුත් එහි වටිනාකම් නිශ්චිතව හා වෙන් වෙන්ව දක්වා නොතිබීම හේතුවෙන් එම වත්කම් සභාවේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

වත්කම් ගිණුම් 03 කට අදාළව ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛණ සමඟ සැසඳීමේ දී රු. 467,097 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 371(2) (ඇ) | 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ අත්තිකාරම් ශේෂය රු.876,052 ක් වූ අතර ඉන් රු.651,637ක් වර්ෂ 05කට වඩා පැරණි ශේෂයන්ගෙන් සමන්විත වී තිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 396(ඇ) | බැංකු ගිණුම් දෙකකට අදාලව පිළිවෙලින් එකතුව රු.147,056 ක් වූ චෙක්පත් 31 ක් සහ එකතුව රු.29,793 ක් වූ චෙක්පත් 30 ක් මාස 06 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ අතර, එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |
| | (iii) | මුදල් රෙගුලාසි 565 | වර්ෂ 03 ඉක්මවූ එකතුව රු.1,453,270 ක් වූ තැන්පතු හා 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ රු.125,490 ක ආරක්ෂණ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | | |
| | (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු.29,421,880 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | (ii) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව,සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.30,791,896ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.50,961,490 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,169,594 කින් පිරිහීමේ අඩුවීමක් දක්නට ලැබුණු අතර සභාවේ මුළු ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 72 කින් ඉහළ යාම මෙම පිරිහීම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

2013 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එහි සමහර අංශවල අරමුණු සපුරා ගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. විගණනයේදී නිරීක්ෂණය වූ එම අංශ කිහිපයක භෞතික කාර්ය සාධනය පහත දැක්වේ.

(අ) **භෞතික ප්‍රගතිය**

| ක්‍රියාකාරකම් | අපේක්ෂිත ඉලක්කය | ඉටුකරගත් ප්‍රමාණය | ලඟාකර ගැනීමට අපොහොසත් වූ ප්‍රතිශතය |
|---|---|---|---|
| හස්ත කර්මාන්ත අලෙවි ගම්මාන | 02 | - | 100 |
| හස්ත කර්මාන්ත සුහසාධක වැඩ සටහන් | 25 | 18 | 28 |
| අමුද්‍රව්‍ය වගාව සඳහා පැල | 106,950 | 10,000 | 91 |
| පුහුණුවන්නන්ට උපකරණ කට්ටල | 500 | 138 | 72 |
| මූලික තාක්ෂණ පුහුණු වැඩසටහන් | 40 | 32 | 20 |
| මධ්‍යම තාක්ෂණ පුහුණු වැඩසටහන් | 10 | 08 | 20 |
| හස්ත කර්මාන්තකරුවන් සඳහා විදේශීය පුහුණු වැඩසටහන් | 02 | - | 100 |
| පුහුණු මධ්‍යස්ථාන නවීකරණය ගණන | 15 | 10 | 33 |

අංශ අටක භෞතික කාර්ය සාධනය අපේක්ෂිත ඉලක්ක වලින් ඉටුකරගත් ප්‍රමාණය සියයට 100 සිට සියයට 20 දක්වා පරාසයක විය.

**(ආ) මූල්‍ය ප්‍රගතිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වැය විෂයයන් 04 ක ඇස්තමේන්තුගත මුදල් ඉක්මවා සියයට 126 සිට සියයට 172 දක්වා ප්‍රමාණයක් වියදම් කර තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශිල්පීන් ලියාපදිංචි කිරීම, මූලික තාක්ෂණ පුහුණු වැඩසටහන් හා සංවිධානය කළ දේශීය අළෙවිපොළ සංඛ්‍යාවේ අඩුවීමක් දක්නට ලැබිණි. තවද පුහුණු මධ්‍යස්ථානවල නිෂ්පාදන පහසුකම් ලබා ගන්නා ශිල්පීන්ගේ අඩුවීමක් තිබීම හේතුවෙන් පුහුණු මධ්‍යස්ථානවල සියයට 20ක ආදායමේ අඩුවීමක් සිදු වී තිබු බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්පීය පුහුණු මධ්‍යස්ථානවල පුහුණු කටයුතු සහ ඒවායේ අධීක්ෂණ කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) සීගිරිය ශිල්ප ගම්මානයේ කුලියට දී ඇති කුටි වලින් 2013 දෙසැම්බර් 09 දිනය වන විට සිටි ශිල්පීන්ගෙන් පමණක් අයවීමට ඇති හිඟ කුලී ගාස්තුව රු.123,000 ක් විය.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අංක 13/1/225/10/8/551 දරන 1990 ඔක්තෝබර් 29 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ 99 අවුරුදු බදු කුලී ගිවිසුම මත ශිල්ප සභාවට පවරා ඇති ඉඩමේ, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මගින් පාලනය වන "අපේ ගම" පිහිටුවා ඇති අතර මෙම ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයක් ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ශිල්ප සභාව විසින් "අපේ ගම" තුළ වාර්ෂිකව පවත්වනු ලබන ශිල්ප ප්‍රදර්ශණ වලින් ජයග්‍රහණය කළ විශිෂ්ඨ කලා නිර්මාණයන්ගෙන් යුත් ශිල්ප කෞතුකාගාරයක් "අපේ ගම" තුළ පිහිටුවා ඇති අතර, එහි නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.60,000 ක් වැය කර තිබූ නමුත් එම මුදල හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ග්‍රාමීය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලද අක්කර 03 කින් සමන්විත "සීගිරිය ශිල්ප ගම්මානය" වර්තමානයේ ගොඩනැගිලි 04 කින් හා අළෙවි කුටි 40 කින්

සමන්විත වුව ද ප්‍රයෝජනයට ගනු ලබන්නේ එක් ගොඩනැගිල්ලක් හා අළෙවි කුටි 09 ක් පමණි.ලක්සල සඳහා ලබා දී තිබූ ගොඩනැගිල්ල, දේශන ශාලාව, ආපන ශාලාව, වැසිකිළි සංකීර්ණය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර පාවිච්චි කිරීමට ජලය නොමැතිවීම, සංචාරකයන් නොපැමිණ නිසා ශිල්පීන්ගේ ආදායම් අඩුවීම ගම්මානය පවත්වාගෙන යාම අපහසු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණි.

(ආ) පහල හපුවිද ලාක්ෂා කැටයම් පුහුණු මධ්‍යස්ථානයේ ඇති ආයුධ හා උපකරණ නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියමිත දිනට සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.6,649 ක් අධිභාර පනවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේ දී රු.1,431,316 ක් වැය කර ජාතික ශිල්ප සභා ප්‍රදර්ශනාගාරය විධිමත් කිරීම හා අභ්‍යන්තර අලංකරණය සිදු කර ගොඩනැගිල්ල සහ ශිල්ප සභා භූමියේ ශිල්ප ගම්මානයට පිවිසීම සඳහා රු.1,152,902 ක් වැය කර ඉදිකරන ලද දැව පාලම විවෘත කිරීමටත් පෙර වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා කඩා ඉවත් කර තිබුණි. මුදල් රෙගුලාසි 504 ප්‍රකාරව මෙම වත්කම් පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ජාතික ශිල්ප සභාවේ 2013 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම මට්ටමේ පුරප්පාඩු දෙකක් හා ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 29 ක් පැවතීම නිසා සභාවේ වැඩ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාම ගැටළු සහගත වූ අතර ප්‍රාථමික මට්ටමේ නිලධාරියෙකු අතිරික්තව පැවතුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානය වෙත යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) අත්තිකාරම් පාලනය
(ඇ) අදාළ නෛතික විධිවිධාන අනුගමනය කිරීම
(ඈ) අයවැය පාලනය
(ඉ) ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම